# පුරවැසි අධ්‍යාපනය

## කෙටි සටහන් පොත

## 10 හා 11 ශ්‍රේණිය




* සැකසුම : ඩබ්.කේ.ටී. ලක්මාලි
* පාසල : ර/ශ්‍රී අභයතිස්ස විද්‍යාලය

# ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

1 විවිධ පාලන ක්‍රම - රාජාණ්ඩු, රදළ ආණ්ඩු, ප්‍රජාතන්ත්‍රවාදි පාලනය

2 ප්‍රජාතන්ත්‍රවාදය ආරම්භ වූයේ - ග්‍රීසියේ ඇතැන්ස්

3 ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය - පුරවැසි සභාව

4 ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලනයට සම්බන්ධ නොවූවන් - කාන්තාවන්, වහලුන්, විදේශකයන්

5 සමූහාණ්ඩු පාලනය - ඉන්දියාවේ වජ්ජි ජනපදය

6 සප්ත අපරිහානි ධර්මය - ★නිතර රැස්වීම හා සාකච්ඡා කිරිම

★සමඟිව රැස්ව සමඟිව සාකච්ඡා කර සමඟිව විසිරයාම

7 වැඩවසම් සමාජ ක්‍රමය - ක්‍රි.ව.5 – 15 සියවස

8 පාලන කටයුතු සඳහා ජනතා සහභාගීත්වය ඇති වූ අවස්ථාව - ඉංග්‍රීසි විප්ලවය (උත්කෘෂ්ට විප්ලවය)

9 ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප - ඍජු ප්‍රජාතන්ත්‍රවාදය හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

10 ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක නොවන්නේ,

- ජනගහනය අධිකවීම ★රාජ්‍ය භූමි ප්‍රමාණය විශාලවීම
- අවශ්‍යතා සංකීර්ණවීම

11 ප්‍රජාතන්ත්‍රවාදය ගැන නිර්වචන - ★ඒබ්‍රහම් ලින්කන් ★ සීලර්

12 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අංග ලක්ෂණ

- තරඟකාරී පක්ෂ ක්‍රමය ★අධිකරණයේ ස්වාධීනත්වය
- ඡන්ද කොට්ඨාස ක්‍රමය ★නිදහස් හා සාධාරණ මැතිවරණ

13 ජනතාව සතු බලය - පරමාධිපත්‍ය බලය(පාලන බලතල,ඡන්ද බලය, මූලික අයිතිවාසිකම්)

14 ලංකාවේ මැතිවරණ - ජනාධිපතිවරණය, මහ මැතිවරණය, පළාත් පාලන ආයතන මැතිවරණ

15 පක්ෂ ක්‍රමයේ ස්වරූප

- ඒක පක්ෂ - චීනය, කියුබාව, උතුරු කොරියාව
- ද්වි පක්ෂ - ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය
- බහු පක්ෂ - ශ්‍රී ලංකාව, ඉන්දියාව

16 තරගකාරි පක්ෂ ක්‍රමයේ ලක්ෂණ

- මහජන නියෝජනයට ඇති ඉඩකඩ පුළුල්වීම
- අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම
- බහුවිධතාව තුළින් එක්සත්කම ගොඩනැගීම

17 නියෝජන ක්‍රම - සරල බහුතර නියෝජනය හා සමානුපාතික නියෝජනය

18 ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම - මැතිවරණ සීමා නීර්ණය කිරීමේ කොමිෂන් සභාව

19 ඡන්ද කොට්ඨාස බෙදීමේ නිර්ණායක - භූමිය හා ජනගහනය

20 ඡන්ද කොට්ඨාස බෙදීමේ ප්‍රයෝජන -

- ප්‍රාදේශීය සංවර්ධනයට ඇති ඉඩකඩ පුළුල් වීම
- ඡන්ද කොට්ඨාසයට වග කියන නායකයෙක් තෝරා ගතහැකි වීම

21 නිදහස් හා සාධාරණ මැතිවරණයක් ලක්ෂණ

- නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම
- මැතිවරණ නීතිරීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම
- සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැක්වීම

22 විරුද්ධ පක්ෂයෙන් ඉටුවන කාර්යය

- ආණ්ඩුවේ යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දීම
- වඩාත් යහපත් විකල්ප ආණ්ඩුක් පිහිටුවීමට කටයුතු කිරීම
- ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධි ක්‍රියා විවේචනය කිරීම

23 නිදහස පිළිබඳ නිර්වචනය - ජී.ඩී.එච්. කෝල්

24 රටක මූලික නීතිය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

25 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමේ ප්‍රයෝජන

- මූලික අයිතිවාසිකම් ආරක්ෂා වීම
- අධිකරණයේ ස්වාධිනත්වය සුරක්ෂිත වීම
- නීතියේ රැකවරණය සැමට සමාන ව ලැබීම

26 නිදහස් ජනමාධ්‍ය මඟින් ඉටුවන කාර්යය

- සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාව වෙත ලබා දීම
- ජනතාවගේ දැනුම වර්ධනය කිරීම
- කාලීන තොරතුරු නිසි වේලාවට ජනතාව වෙත ලබා දීම

27 අධිකරණය මඟින් - යුක්තිය පසිඳලීම

28 නීතියේ ආධිපත්‍යය යනු - රටක සැමට ඉහළින් නීතිය පැවතීම

29 නීතියේ ආධිපත්‍ය පවතින බවට විදහාපාන ලක්ෂණ

- නීතිය ඉදිරියේ සමානාත්මතාව
- වරදකරුවන්ට දඬුවම් හිමිවීම
- චෝදනා පතයකට අනුව පමණක් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම

30 රාජ්‍යයක ලක්ෂණ - භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය බලය

31 රාජ්‍ය පිළිබඳ නිර්වචන - මහාචාර්ය ගානර්, ඇරිස්ටෝටල්

32 15වන සියවසින් පසු බිහි වූ රාජ්‍යය - ජාතික රාජ්‍ය

33 ජාතික රාජ්‍යයක ලක්ෂණ

★ එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම

★ වෘත්තීය නිලබල පැලැන්තියකින් පාලනය වීම

34 ප්‍රථම ජාතික රාජ්‍යය - එංගලන්තය හා ප්‍රංශය

35 ජාතික රාජ්‍ය බිහිවීමට හේතු - පුනරුදය හා විද්‍යාත්මක දැනුම වර්ධනය

36 එංගලන්තය, ප්‍රංශය ප්‍රබල ජාතික රාජ්‍යය වීමට හේතු

- දියුණු ආර්ථික තත්ත්වය ★යුධ හා නාවික ශක්තිය

37 රාජ්‍යයක භූමිකාව/ කාර්යය

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ★පොදු සේවා පවත්වාගෙන යාම

38 රාජ්‍යයන්ගේ ස්වරූප = ★ඒකීය රාජ්‍යය ( ශ්‍රී ලංකාව, ප්‍රංශය, බ්‍රිතාන්‍යය)

★සන්ධීය රාජ්‍යය (ඇමෙරිකාව, ඉන්දියාව, ස්විට්සර්ලන්තය)

39 ආණ්ඩුව - රජයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආයතනය

40 ආණ්ඩුව පිළිබඳ නිර්වචන - මහාචාර්ය ගානර්

41 ආණ්ඩුවේ කොටස්/ අවයව

- ව්‍යවස්ථාදායකය - නීති සම්පාදනය, මුදල් පාලනය
- විධායකය - නීති ක්‍රියාත්මක කිරීම
- අධිකරණය - යුක්තිය පසිඳලීම/ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

42 ආණ්ඩුක්‍රමවල ස්වරූප

- පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය - නාමික හා සත්‍ය විධායක දෙකකි.
  ව්‍යවස්ථාදායකයෙන් විධායකය තේරී පත් වේ
- ජනාධිපති ආණ්ඩුක්‍රමය - විධායක බලය ජනාධිපති හසුරුවයි.
  විධායකය ව්‍යවස්ථාදායකයට සෘජුව බැඳී නැත.

43 පුරවැසියෙකු සතු යුතුකම් වර්ග දෙකකි - නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම්

44 රජය කෙරෙහි පුරවැසි යුතුකම්

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම ★සමානතාත්මතාව ආරක්ෂා කිරීම
- පරිසරය ආරක්ෂා කිරීම

45 ප්‍රජාතන්තවාදි පාලනයක් සාර්ථක වීමට අවශ්‍ය අංග

- නිදහස් හා සාධාරණ මැතිවරණ ★ නීතියේ ආධිපත්‍යය
- අධිකරණයේ ස්වාධීනත්වය

46 ප්‍රජාතන්ත්‍රවාදි පුරවැසියෙතු සතු ගුණාංග

විරුද්ධ මත ඉවසීම, නීතිගරුකවීම, සහයෝගයෙන් කටයුතු කිරීම

47 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක වැදගත්කම

- සමාන අයිතිවාසිකම් හිමිවීම ★පුද්ගල හැකියා සංවර්ධනයට ඉඩ ලැබීම

# බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම

1. බලය - රාජ්‍යයේ පාලන කටයතු පවත්වාගෙනයාම සඳහා එයට ඇති හැකියාව
2. බලයේ අවසාන හිමිකරු - මහ ජනතාව
3. බලයේ ස්වරූප - දේශපාලන බලය, පරිපාලන බලය, ආර්ථික බලය
4. බලය විමධ්‍යගත කිරීම - මධ්‍යම ආණ්ඩුව සතුවන පරිපාලන බලතල යම් ප්‍රමාණයක් පාර්ලිමේන්තු පනතකින් ප්‍රාදේශීය ඒකක වෙත පවරාදීම යි.
5. බලය විමධ්‍යගත කරන ආකාර - ★පරිපාලන රටාව විමධ්‍යගත කිරීම
   ★ප්‍රාදේශීය ඒකක වෙත ආණ්ඩුවේ කාර්යයන් පවරාදීම
6. බලය විමධ්‍යගත කිරිමෙන් මඟින් බිහි වන රාජ්‍යය - ඒකීය රාජ්‍යය
7. බලය බෙදාහැරීම - ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රාදේශීය ආණ්ඩු (ප්‍රාන්ත) වෙත පවරා දීම යි.
8. බලය බෙදා හැරීමෙන් බිහිවන රාජ්‍යය - සන්ධීය රාජ්‍යය
9. රාජ්‍යයන් වර්ග දෙක - ඒකීය රාජ්‍යය හා සන්ධීය රාජ්‍යය
10. ඒකීය හා සන්ධීය රාජ්‍යය

| ඒකීය රාජ්‍යවල ලක්ෂණ | සන්ධීය රාජ්‍යවල ලක්ෂණ |
|---|---|
| 1. ආණ්ඩුව සතු බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් ක්‍රියාවට නංවයි. | 1. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම |
| 2. පාර්ලිමේන්තු පනතකින් පරිපාලන බලතල විමිධ්‍යගත කරයි. | 2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හරියි. |
| 3. ඕනෑ ම අවස්ථාවක විමධ්‍යගත කරන ලද බලතල නැවත පවරා ගත හැකියි. | 3. ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයකට පැවරීම |

11. සන්ධීය රාජ්‍යයක බලය බෙදා හරිනු ලබන ඒකක දෙක - මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතර
12. **ඒකීය රාජ්‍යය**
    - පවතින ආණ්ඩුව - ඒකීය ආණ්ඩුව
    - රටවල් - ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය
    - නිර්වචන - මහාචාර්ය හරමන් ජේ. ෆයිනර්, මහාචාර්ය ඒ.වී. ඩයිසි
    - වාසි - ඉක්මනින් හා පහසුවෙන් ආණ්ඩුවට තීරණ ගත හැකි වීම
13. **සන්ධීය රාජ්‍යය ( පෙඩරල් රාජ්‍යය)**
    - පවතින ආණ්ඩුව - සන්ධීය ආණ්ඩුව
    - රටවල් - ඇමෙරිකාව, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව
    - නිර්වචන - ඒ.වී.ඩයිසි, මහචාර්ය කේ.සී.ත වියරේ
    - යහපත් ලක්ෂණ - ★ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම
      ★විශාල රාජ්‍යවල පරිපාලන තීන්දු ගැනීම පහසුවීම

14. බ්‍රිතාන්‍ය පාලන සමයේ මහ නගර සභා - කොළඹ, ගාල්ල, මහනුවර
15. පළාත් ගණන - 09
16. පළාත් සභා පිහිටවූයේ - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන සංශෝධනය
17. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය කරන්නේ - ආණ්ඩුකාරවරයා
18. පළාත් ආණ්ඩුකාරවරයා පත් කරන්නේ - ජනාධිපති
19. පළාත් ආණ්ඩුකාරවරයාගේ බලතල - පළාත් සභාව ඇමතීම හා සංදේශ යැවීම
    පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම, විසුරුවීම
20. මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලයේ බලතල - පළාත් ආණ්ඩුකාරවරයාට උපදේස් ලබාදීම
    පළාත් අයවැය ලේඛන සකස් කිරීම
21. පළාත් සභා සතු බලතල ලැයස්තු 03
    i පළාත් සභා ලැයිස්තුව (37) - පළාත් පාලන කටයුතු, ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම
    ii සංවෘත ලැයිස්තුව (ම. ආණ්ඩුව - 17) - විදේශ කටයුතු, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන කටයුතු
    iii සමගාමී ලැයිස්තුව - සැලසුම් කිරීම, ජාතික නිවාස සහ ඉදි කිරීම
    (මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා - 36)
22. පළාත් පාලන ආයතන - මහ නගර සභාව, නගර සභාව. ප්‍රාදේශීය සභාව
23. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ - මහ සභාව
24. **ඇමෙරිකා එක්සත් ජනපදය**
    - රාජ්‍යයේ ස්වරූපය - සන්ධීය රාජ්‍යය
    - ආරම්භක ජනපද - 13 ★වර්තමාන ප්‍රාන්ත - 50
    - ආණ්ඩුක්‍රම ව්‍යූහයේ ලක්ෂණ - ★විධායක ජනාධිපති විධායක බලතල ක්‍රියාත්මක කරයි
      ★ෆෙඩරල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම
    - මධ්‍යම ආණ්ඩුවේ බලතල - මූල්‍ය කටයුතු, ජාතික ආරක්ෂාව සැලසීම
    - ප්‍රාන්ත ආණ්ඩුවල බලතල - අධ්‍යාපනය, සෞඛ්‍යය
25. **ස්විට්සර්ලන්තය**
    - රාජ්‍යයේ ස්වරූපය - සන්ධීය රාජ්‍යය
    - ප්‍රාන්ත නම හා ගණන - කැන්ටන් - 26
    - නිල භාෂා - ජර්මන්, ප්‍රංශ, ඉතාලි
    - ආණ්ඩුක්‍රම ව්‍යූහයේ ලක්ෂණ - ★සාමූහික විධායකයක් (සන්ධීය මහ මණ්ඩලය) පවතී.
      ★ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුවක් පවතී.
    - මධ්‍යම ආණ්ඩුවේ බලතල - විදේශ කටයුතු, ආරක්ෂාව හා හමුදා කටයුතු
    - ප්‍රාන්ත (කැන්ටන්) බලතල - කර්මාන්ත, මහ මාර්ග
    - සුවිශේෂ ලක්ෂණ - ★කැන්ටන්වලට තම බලය ක්‍රියාවට නංවමින් ස්වාධීනව
      කටයුතු කිරීමට අවස්ථාව අහිමි වීම

# බහු සංස්කෘතික සමාජය

1 සංස්කෘතියක ලක්ෂණ - ආගම, භාෂාව, සිරිත්විරිත්

2 බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ

- එක ජන කොටසක වුව ද ප්‍රාදේශීය විවිධත්වයක් පැවතීම
- විවිධ ජන වර්ග, ආගමික විශ්වාස දරණ පුද්ගලයින් එකට ජීවත්වීම

3 ඉතා සංකීර්ණ බහු සංස්කෘතික රටවල් - ඉන්දියාව, ඇමෙරිකා

4 ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක්වීමට බලපෑ හේතු

- පිහිටීම ( භූගෝලීය පිහිටීම, ඉන්දියාවයට ආසන්නව පිහිටීම)
- සංක්‍රමණ (විජය ඇතුළු පිරිස, මිහිඳු හිමි ඇතුළු පිරිස)
- ආක්‍රමණ (සේන ගුත්තික ආක්‍රමණය, කාලිංග මාඝ ආක්‍රමණය)

5 සමාජ සාධාරණත්වය බිඳවැටීමට හේතු

- අල්ලස් හා දූෂණය ඉහළ යාම
- රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම
- රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව

6 යහපාලනයක මූලික ගුණාංග

- මාධ්‍ය නිදහස ආරක්ෂා වීම
- අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
- මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම

7 බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන ප්‍රයෝජන

- එකිනෙකාට ගරු කිරීමට හුරු වේ.
- එකිනෙකා අතර විශ්වාසය තහවුරු වේ
- එකිනෙකා අතරඅවබෝධය පුළුල් වේ

8 වෙනස්කම් තුළින් එකමුතුකම තේමා කරගත් රටවල් - සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය

9 බහු සංස්කෘතික ජන සමාජයක පුරවැසියෙකු ප්‍රගුණ කළ යුතු ගුණාංග

- සමානාත්මතාව ★අන්‍ය මත ඉවසීම ★අන් ආගම්වලට ගරු කිරීම

10 බහු සංස්කෘතික ජන සමාජයක එක්සත්ව සිටීමෙන් ඇතිවන ප්‍රයෝජන

- ගැටුම් අවම වේ ★අයිතිවාසිකම් ආරක්ෂා වේ.
- ජාතික සමගිය වර්ධනය වේ

# ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා

1 මූලික අවශ්‍යතා - ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම්

2 අවශ්‍යතා - මිනිසාගේ පැවැත්මට අවශ්‍ය දේ

3 වුවමනා - අවශ්‍යතා ඉටු කරගන්නා විවිධ ස්වරූප

4 මූලික ආර්ථික ප්‍රශ්න -
1. කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද
2. කෙසේ නිෂ්පාදනය කරන්නේද
3. කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද

5 නිෂ්පාදනයට යොදා ගන්නා ශිල්පීය ක්‍රම - ශ්‍රම සූක්ෂම හා ප්‍රාග්ධන සූක්ෂම

6 භාණ්ඩ කොටස් දෙකකි - ආර්ථික භාණ්ඩ හාආර්ථික නොවන භාණ්ඩ

7 නිෂ්පාදක සාධක හා ගෙවීම් -
★ භූමිය - කුලිය
★ ශ්‍රමය - වැටුප
★ ප්‍රාග්ධනය - පොළිය
★ ව්‍යවසායකත්වය - ලාභය

8 ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි - නිෂ්පාදනය, බෙදා හැරීම, පරිභෝජනය

9 නිෂ්පාදනය කරන අංශ - කෘෂිකාර්මික, කාර්මික, සේවා

10 නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ලන්නා ආකාර අනුව භාණ්ඩ

- පාරිභෝගික භාණ්ඩ - ආහාර, ඖෂධ, ඇඳුම් පැළඳුම්
- අන්තර් භාණ්ඩ - දැව, පොහොර
- ප්‍රාග්ධන භාණ්ඩ - ගොඩනැගිලි, වාහන, යන්ත්‍රසූත්‍ර

11 විවිධ අර්ථ ක්‍රම

- ධනවාදි අර්ථ ක්‍රමය - ඇමෙරිකාව,ජපානය - තරඟකාරි වෙළෙඳපොළක් ඇත
- සමාජවාදි අර්ථ ක්‍රමය - කියුබාව, උ.කොරියාව - දේපළ අයිතිය රජය සතුවීම
- මිශ්‍ර අර්ථ ක්‍රමය - ශ්‍රී ලංකාව

12 පරිවර්තන ආර්ථිකයක ලක්ෂණ

- ආර්ථික ලිහිල්කරණය
- පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සැලසීම

13 ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ ආර්ථිකයේ ලක්ෂණ

- පෞද්ගලික අංශය දිරි ගැන්වීම
- රජය ව්‍යවසාය කටයුතුවලින් ඈත්වීම

14 සංවර්ධනයේ අංශ - ආර්ථික සංවර්ධනය තිරසර සංවර්ධනය, සමාජ සංවර්ධනය

15 තිරසර සංවර්ධනයේ දී සැලකිය යුතු අංශ

★පරිසර සුරක්ෂිතතාව ★ස්වාභාවික සම්පත් සංරක්ෂණය

16 සංවර්ධන ක්‍රියා නිසා ලංකාවට අත්වී තිබෙන වාසි

- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළයාම
- යටිතල පහසුකම් දියුණුවීම
- නව රැකියා අවස්ථා ලැබීම

17 ගෝලීයකරණයේ ලක්ෂණ

- වැඩ ලෝකය පුළුල්වීම
- ගෝලීය වෙළෙඳපොළ පුළුල් වීම
- ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකිවීම

18 ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකයේ ලක්ෂණ

- විවිධ කලාපීය සංවිධාන බිහිවීම
- බහු ජාතික සමාගම් බිහිවීම

19 ගෝලීයකරණයේ ධනාත්මක ලක්ෂණ

- ආර්ථිකය විවිධාංගීකරණය
- යටිතල පහසුකම් සංවර්ධනය වීම
- දේශිය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම

20 ගෝලීයකරණයේ ඍණාත්මක ලක්ෂණ

- බුද්ධි ගලනය
- දේශීය සම්පත් සූරාකෑමට ලක්වීම
- විදේශ ණය හා ආධාර මත යැපීමට සිදුවීම

## ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය

| | | |
|---|---|---|
| 1. මනසේ සාමය ඇති කරගැනීමට | - | භාවනා කිරීම, ස්වාභාවික පරිසරය නිරීක්ෂණය කිරීම |
| 2. ත්‍රිකෝණ අරගල ගැටුම් (ජොහාන් ගැල්ටුන්) | - | ★චර්යාව (හැසිරීම)<br>★සන්දර්භය (ගැටුමට පසුබිම)<br>★ආකල්ප (මනොවිද්‍යාත්මක සාධක |
| 3. ගැටුම් ඇතවන පාර්ශ්ව | - | පුද්ගලයා තුළ, පුද්ගලයන් අතර,රටවල් අතර |
| 4. ගැටුම්වලට හේතු | - | විවිධ ප්‍රතිරූප, වෙනත් අදහස්, මානසික තත්ත්ව |
| 5. ගැටුම් වර්ග | - | අභ්‍යන්තර ගැටුම් හා අන්තර්ජාතික ගැටුම් |
| 6. අභ්‍යන්තර ගැටුම් වර්ග | - | සූක්ෂම ගැටුම්(පවුල් ගැටුම්), සාර්ව ගැටුම්(ආගම් ගැටුම්) |
| 7. අන්තර්ජාතික ගැටුම් වර්ග | - | මතවාදී ගැටුම් හා යුධමය ගැටුම් |
| 8. ගැටුම් ඇතිවන මූල | - | ★දේශපාලන මූල<br>★වාර්ගිතකත්වය ★ආගමික මතවාද |
| 9. ගැටුම් නිරාකරණයේ ක්‍රම | - | සාකච්ඡා කිරීම, මැදිහත්කරණය, සමථකරණය |

10. සාකච්ඡා ක්‍රමයේ ලක්ෂණ - ජය-ජය විසඳුම් ලැබීම, වියදම් අවම වීම, අවිධිමත් ක්‍රමයකි.
11. සේවා සේවක ගැටුම් විසඳීමට - සහමන්ත්‍රණය හා කේවල්කරණය
12. කේවල් ක්‍රමයේ ලක්ෂණ - කණ්ඩායම් ක්‍රියාවලියකි, විධිමත් ක්‍රියාවලියකි.
13. මැදිහත්කරුවෙකු තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු
    - දෙපාර්ශ්වයට ම බලපෑම් එල්ල නොකිරීම
    - දෙපාර්ශ්වය ම පිළිගන්නා අපක්ෂපාති පුද්ගලයෙකු වීම
14. බේරුම්කරුවෙකුගේ හෝ මැදිහත්කරුවෙකුගේ ගුණාංග -

    ★අවංකවීම, ★අපක්ෂපාතිබව, ★කැපවීම
15. සමථකරණය යොදා ගත හැක්කේ - පවුල් ආරවුල්, කම්කරු ආරවුල්සුළු වැරදි විසඳීම
16. සමථකරුගේ කාර්යය - ප්‍රතිවිරුද්ධ පක්ෂයන් අතර සංවාදයක් ගොඩනැගීම

    සම්මුතීන්ට එළඹීමට අවශ්‍ය වැඩපිළිවෙලක් යෝජනා කිරීම
17. ගැටුම් විසඳීමේ සාම්ප්‍රදායික ක්‍රමය - විනිසීම
18. විනිසීමේ ලක්ෂණ - විත්තිකරු අධිකරණයේ පෙනී සිටිය යුතුය.

    අභියාචනා කිරීමේ හැකියාව
19. එකඟත්වයෙන් විසඳා ගත හැකි ගැටුම්- පවුල් ආරවුල්, අසල්වාසීන් සමඟ ආරවුල්
20. ගැටුම් විසඳීමට පුද්ගලයෙකු සතු ගුණාංග
    - i පුද්ගල ගුණාංග - ඉවසීම, දරාගැනීමේ ශක්තිය,සංවේදි බව, කරුණාව
    - ii සමාජයීය ගුණාංග - සවන්දීම, අන් මත ගරු කිරීම, පරිත්‍යාගශිලි බව
21. ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වාසි/ ප්‍රයෝජන
    - i ජීවිත හා දේපල හානි අවම වීම
    - ii සාමය ඇති වීම
    - iii මානව අයිතිවාසිකම් ආරක්ෂා වීම

## නීතිය හා යුක්තිය

1. නීතිය පිළිබඳ නිර්වචන - ටී.එච්. ග්‍රීන්, ජෝන් ඔස්ටින්
2. නීතියේ ගුණාංග - ★යුක්ති සහගත ව හා සාධාරණ විය යුතු ය.

   ★නිරවුල් ව හා පැහැදිලිව දැක්විය යුතු ය.

   ★නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම
3. නීතියේ මූලශ්‍ර - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ආගම, සිරිත් විරිත්
4. නීති වර්ග - දේශීය නීතිය හා අන්තර්ජාතික නීතිය
5. දේශීය නිතී - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, අපරාද නීතිය සිවිල් නීතිය
6. අන්තර්ජාතික නීති - අන්තර්ජාතික පරිසර නීතිය, අන්තර්ජාතික සාගර නීතිය
7. ශ්‍රී ලංකාවේ පොදු නීතිය රෝම ලන්දේසි නීතිය
8. ලංකාවේ විශේෂ නීති - උඩරට නීතිය, තේසවලාම් නීතිය(භූමියේ චාරිත්‍රය), මුස්ලිම් නීතිය

9. ලන්දේසි අධිකරණ දිස්ත්‍රික්ක - කොළඹ, ගාල්ල, යාපනය
10. ලංකාවේ අධිකරණ - ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය
11. අධිකරණ බලය සහිත ආයතන - කාති උසාවි, සමථ මණ්ඩල, වෙල් කුලී මණ්ඩල
12. ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රධානී - අගවිනිසුරුතුමා
13. ශ්‍රේෂ්ඨාධිකරණ බලතල - ජනාධිපති පෙත්සම් විභාග කිරීම, උපදේශනාත්මක අධිකරණ බලය
14. අභියාචනාධිකරණ බලතල - පාර්ලිමේන්තු පෙත්සම් විභාග කිරීම,විවිධ ආඥා නිකුත් කිරීම
15. පළාත්බද මහාධිකරණ බලය - වාණිජ ආරවුල් විසඳීම, පහළ අධිකරණවල අභියාචනා විසඳීම
16. මහාධිකරණයේ බලතල - නාවුක අධිකරණ බලය, බරපතල අපරාධ පිළිබඳ අදිකරණ බලය
17. දිසා අධිකරණය විසඳන නඩු - විවාහ සම්බන්ධ නඩු, ඉඩම් නඩු, බෙදුම් නඩු
18. මහේස්ත්‍රාත් අධිකරණය විසඳනුයේ- මැතිවරණ සම්බන්ධ වැරදි, මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි
19. නීතිය පිළිබඳ ඉහළ ම තලයේ භූමිකා/ නීතිය ක්‍රියාවඉ නංවන නිලධාරීන් තිදෙනා

★අග්‍රවිනිශ්චයකාරතුමා ★අධිකරණ ඇමති ★නීතිපති

20. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා = නීතිපතිතුමා
21. නීතිපතිතුමාගේ කාර්යය -
    - රාජ්‍ය සම්බන්ධ නඩුවලදී රජයට අවශ්‍ය උපදෙස් ලබා දීම
    - රාජය හෝ රාජ්‍ය ආයතන සම්බන්ධ කටයුතුවල දී රජය වෙනුවෙන් පෙනී සිටීම
22. නීතිපතිතුමාට සහාය වන නිලධාරීන්

★රජයේ අධි නීතිඥවරුන් ★සොලිසිටර් ජනරාල්

23. ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම
    - බේරුම්කරණය
    - ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු වීම (පරිපාලන ක්‍රියා මඟින් මිනිස් අයිතිවාසිකම් කඩ ව විට
    - මානව හිමිකම් කොමිසම වෙත යොමු වීම
24. නීතියේ ආධිපත්‍යය සහිත සමාජයක ලක්ෂණ
    - ස්වාධීන අධිකරන පද්ධතියක් පැවතීම
    - සාධාරණ ව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම
    - නීතිය ඉදිරියේ සැමට සමානාත්මතාව
25. අධිකරණයෙ ස්වාධීනත්වය ඇති කිරීමට ගෙන ඇති පියවර
    - විනිශ්චයකරුවන් ඉවත් කිරීමට විධිවිධාන දැක්වීම
    - අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම

26. අපක්ෂපාතිව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇති වන තත්ත්ව

★රට තුළ අපරාධ හා දූෂණ වැඩි වීම ★යුක්තිය ඉටු කිරීමට අනියම් ක්‍රම භාවිතය

★නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම

# <u>ආණ්ඩුවේ විවිධ ස්ථර</u>



1. ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රමය - ඒකීය ආණ්ඩුක්‍රමය
2. ඒකීය රාජ්‍යය - මහා බ්‍රිතාන්‍යය, ශ්‍රී ලංකාව, ජපානය, ප්‍රංශය
3. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
   - i 1833 - කෝල්බෲක් ආණ්ඩුක්රමය - දිවයින පළාත් පහකට බෙදීම, අනිවාර්ය සේවා රාජකාරි ක්රමය අහෝසි කිරීම
   - ii 1910 - කෲව් මැකලම් ආණ්ඩුක්රමය - සීමිත ඡන්ද බලය හඳුන්වාදීම
   - iii 1921 - මැනිං ආණ්ඩුක්රමය - පළාත්බද නියෝජනය
   - iv 1931 - ඩොනමොර් ආණ්ඩුක්රමය - විධායක කාරක සභා ක්රමය, සර්ව ජන ඡන්දබලය, රාජ්ය මන්ත්රණ සභාව
   - v 1947 - සෝල්බරි ආණ්ඩු ක්‍රමය - කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදීම, ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුව, අග්‍රාණ්ඩුකාර තනතුර ඇති කිරීම
4. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය නිලධාරීන් - රාජ්‍ය ලේකම්, නීති ලේකම්. මුදල් ලේකම්
5. ශ්‍රී ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් වූයේ - 1972
6. ***1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව***
   - ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම
   - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම
   - අග්‍රාණ්ඩුකාර ධූරය වෙනුවට ජනාධිපති ධූරය හඳුන්වාදීම
7. ***1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව***
   - විධායක ජනාධිපති ධූරය හඳුන්වාදීම
   - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම ★ව්‍යවස්ථාදායක, පාර්ලිමේන්තුව ලෙස නම් කිරීම
8. පරිපාලන දිස්ත්‍රික්ක ගණන - 25
9. ශ්‍රී ලංකාවේ බලය බෙදීමට ලත් උත්සහයන් - 1928 ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව
   1980 දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම
10. බ්‍රිතාන්‍ය පාලන සමයේ මුලින් ම පිහිටවූ මහ නගර සභා - කොළඹ, ගාල්ල, මහනුවර
11. ප්‍රාදේශීය ස/භා පිහිටවූයේ - 1987

12. ප්‍රදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට හේතු
    - ජනතාවගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටු කිරීම
    - මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ලිහිල් කිරීම
13. බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු - මුදල් උපායා ගැනීමේ දුෂ්කරතා
    සම්පත් බෙදි යාමේ විෂමතා ඇති වීම

14. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහය/ ආයතන/කොටස්හා කාර්යය

- ව්‍යවස්ථාදායකය - නීති පැනවීම, අයවැය/මුදල් පාලනය, විධායකය පාලනය
- විධායකය - නීති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවය පාලනය
- අධිකරණය - යුක්තිය පදිදලීම, පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

15. විධායකයේ ප්‍රධානියා, සන්නද්ධ සේවාවල සේනාධිනායකයා, - ජනාධිපති
16. ජනාධිපති සතු ව්‍යවස්ථාදායක බලතල - පාර්ලිමේන්තුව ඇමතීම හා සංදේශ යැවීම, පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම, විසුරුවීම
17. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු - මහජන ඡන්දයෙන් - 196 , ජාතික ලැයිස්තුවෙන් - 29
18. පළාත් පාලන ආයතන - මහ නගර සභා, (නගරාධිපති) නගර සභා, (සභාපති) ප්‍රාදේශීය සභා (සභාපති)
19. මහ නගර සභාවලට ඇති බලතල - කුණු කසල ඉවත් කිරීම, නගර අලංකාර කිරීම
20. පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යය තේමා - 03

   i පොදු මංමාවත් - මංමාවත් ඉදි කිරීම, මංමාවත් නඩත්තු කිරීම
   ii මහජන සෞඛ්‍යය - මහජන වැසිකිළි ඉදි කිරීම හා නඩත්තුව, පීඩා පරීක්ෂා කිරීම
   iii පොදු උපයෝගිතා සේවා - ජල සම්පාදනය, මහජන වෙළෙඳපොළ පවත්වාගෙන යාම.

21. පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන

- පහජන උපයෝගිතා සේවා පහසුවෙන් ලබා ගත හැකිවීම
- ප්‍රාදේශීය හා ජාතික නායකයින් බිහිවීමට අවස්ථාව ලැබීම

22. ආණ්ඩුවේ විවිධ ස්තර මගින් පුරවැසියා කෙරෙහි ඉටුවිය යුතු වගකීම්

- නීතිය හා සාමය ආරක්ෂාකිරීම ★සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම
- පරිසරය සංරක්ෂණය කිරීම

23. ආණ්ඩුවේ විවිධ ස්තර කෙරෙහි පුරවැසි වගකීම් හි යුතුකම්

- කුණු කසල නිසි ලෙස බැහැර කිරීම ★ඵලදායී ජීවන වෘත්තියක නියැලීම
- පරිසරය ආරක්ෂා කිරීම ★අන්මත ඉවසීම හා සාධාරණව කටයුතු කිරීම

## <u>මානව හිමිකම් හා යුතුකම්</u>

1. මානව හිමිකම් - මිනිසාට උපතින් ම හිමිවන හිමිකම්
2. මූලික අයිතිවාසිකම් - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති මානව අයිතිවාසිකම්
3. මානව අයිතිවාසිකම් දිනා ගැනීමේ ඓතිහාසික අවස්ථා

   ★ක්‍රි.ව. 1917 රුසියන් විප්ලවය ★ක්‍රි.ව. 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය

4. මානව අයිතිවාසිකම් වර්ග - දේශපාලන අයිතිවාසිකම්, ආර්ථික අයිතිවාසිකම්, සිවිල්
5. මානව හිමිකම් ආරක්ෂා කිරීමට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

6. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

★ජීවත් වීමට ඇති අයිතිය ★ගමනාගමනයට ඇති නිදහස

7. ආර්ථික, සමාජ සංස්කෘතික අයිතිවාසිකම්

★අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය, ★වැඩ කිරීමට ඇති අයිතිය

8. අයිතිවාසිකම් භුක්ති විඳින විශේෂ පුද්ගල කණ්ඩායම්

කාන්තාවන් ළමයින් වැඩිහිටියන්

9. කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් (සිඩෝ සම්මුතිය අනුව) - සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
අධ්‍යාපනයට හා පුහුණුවට ඇති අයිතිය

10. කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර

- කාන්තා කටයුතුපිළිබඳ වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම
- සෑම පොලීසියක ම ළමා හා කාන්තා කටයුතු අංශයක් පිහිටුවීම
- 1933 දී කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම

11. ළමා අයිතිවාසිකම්ආරක්ෂා කිරීමේ විශේෂ අරමුණු

★ආරක්ෂාව ★පැවැත්ම ★සංවර්ධනය

12. ළමා අයිතිවාසිකම් සම්සුතිය සකස් කිරීමට ගත් මූලධර්ම

★සහභාගීත්වය ★ළමයාගේ උපරිම යහපත ★පැවැත්ම සහ සංවර්ධනය

13. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර

- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම
- සෑම පොලීසියක ම ළමා හා කාන්තා කටයුතු අංශයක් පිහිටුවීම
- ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය (1929) පිහිටුවීම

14. කාර්මික සාමය ඇති කිරීමට ලංකා රජය සම්මත කරගත් අණ පනත්

★කාර්මික ආරවුල් පනත ★සේවක අර්ථ සාධක අරමුදල් පනත

15. ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණයට ඇති ප්‍රධාන ආයතනය - මධ්‍යම පරිසර අධිකාරිට

16. පරිසර සංරක්ෂණය සම්බන්ධ ආයතන

★පරිසර අමාත්‍යාංශය ★වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව

★වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

17. මානව හිමිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග

- ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිල්ලක් යොමු කිරීම
- මානව හිමිකම් කොමිසම වෙත ඉදිරිපත්වීම

18. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් - නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම්

# පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය

1. පරිසරය සකස් වී ඇති සංරචක - ජෛවී සංරචක හා අජෛවීය සංරචක
2. ස්වාභාවික පරිසරයට අයත් ප්‍රපංච - වනාන්තර, කඳු, පක්ෂීන්
3. ස්වාභාවික පරිසරයට අයත් සංසිද්ධි - ජල චක්‍රය, කාබන් චක්‍රය
4. පරිසරයෙන් ලැබෙන සේවා - ★ජීව උපකාරක සේවා
   ★ආර්ථික උපකාරක සේවා (අමුද්‍රව්‍ය හා බලශක්තිය)
   ★අපද්‍රව්‍ය අවශෝෂක සේවා
5. පාරිසරික ගැටලුවලට ප්‍රධාන හේතුව - සම්පත් අධි පරිභෝජනය
6. පාරිසරික ගැටලු ඇතිවන ආකාර - ස්වාභාවික ක්‍රියා මඟින් හා මිනිස් ක්‍රියාකරකම් මඟින්
7. පාරිසරික ගැටලු - ජලය දූෂණය වීම. වායු දූෂණය වීම,ගෝලීය උණුසුම වැඩිවීම
8. ජල දූෂණය වන ක්‍රම - ★කර්මාන්තශාලාවල අපද්‍රව්‍ය ජලයට එක් කිරීම
   ★ කෘෂි රසායනික ද්‍රව්‍ය ජලයට එක්වීම
   ★ගෘහස්ථ කුණු කසල ජලයට එකතුවීම
9. ජලය දූෂණය වීමෙන් ඇතිවන ගැටලු - ජලජ ජීවීන් මිය යාම, පරිසර සුන්දරත්වය විනාශවීම
10. ශිලා ගෝලයට සිදුවන බලපෑම් - විවිධ කැනීම් කටයුතු සිදු කිරීම
    කසල අවිධිමත් ලෙස බැහැරකිරීම
11. ශිලා ගෝලයට හානි වීමේ ප්‍රතිඵල - පස නිසරුවීම, ලෙඩ රෝග බෝ වීම
12. වන හායනය නිසා ඇතිවන ප්‍රතිඵල - පාංශු ඛාදනය වීම, පරිසර සුන්දරත්වය විනාශවීම
13. වන හායනය අවම කිරීමට ගත හැකි පියවර - ★රුක් රෝපණය කිරීම,
    ★පරිසර නීතිවලට අනුව කටයුතු කිරීම
    ★කැලෑ ගිනි තැබීමෙන් වැළකීම
14. වායුගෝලයේ වඩි ලෙස ඇති වායු - නයිට්‍රජන්, ඔක්සිජන්, ආගන්
15. වායු දූෂණයට හේතවන වායූන් - කාබන්ඩයොක්සයිඩ්, නයිට්‍රජන් ඔක්සයිඩ්, මීතේන්
16. වායු දූෂණය වන ක්‍රම - ★වනාන්තර විනාශ කිරීම
    ★කසල පිළිස්සීම
    ★කර්මාන්ත ශාලා මඟින් පිට කරන දුම් වායුගෝලයට එකතු වීම
17. වායු දූෂණය වීමෙන් ඇති වන බලපෑම් - ශ්වසන රෝග ඇතිවීම, ගෝලීය උණුසම වීම, හිම කඳු දියවීම
18. දේශගුණික වෙන්ස්වීම් නිසා ඇති වන ප්‍රතිඵල/බලපෑම්
    * ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
    * ලෙඩ රෝග ව්‍යාප්ත වීම
    * වර්ෂාපතන රටාව වෙනස්වීම
19. ජෛව පරිසරයට හානිබවීම නිසා ඇති වන ප්‍රතිඵල
    ★පරිසර සමතුලිතතාව බිඳ වැටීම ★ආවේණික ශාක හා සතුන් විනාශ වීම

20. සමාජ පරිසරයට සිදු වී ඇති බලපෑම් - ★සමාජ විරෝධි ක්‍රියා වැඩිවීම,
★සමාජ සබඳතා බිඳ වැටීම
★පවුල් සබඳතා බිඳ විටීම
21. පරිසරය ආරක්ෂා රජය ගත යුතු ක්‍රියාමාර්ග
* දැනුවත් කිරීම් වැඩසටහන් මඟින් පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීම
* පරිසර නීති රීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම
22. පරිසරය ආරක්ෂා කිරීමට පුරවැසි යුතුකම් - කසල නිසි ලෙස බැහැර කිරීම
පරිසර නීතිරීතිවලට අනුව කටයුතු කිරීම
සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම
23. සංවර්ධනය මැනීමේ අරමුණු - සංවර්ධන ගැටලුහඳුනා ගැනීම
සංවර්ධන විසඳුම් සෙවීමට
රටවල් සමඟ සැසඳීමට හැකිවීම
24. සංවර්ධන මිනුම් - 1. සාම්ප්‍රදායික මිනුම් - දළ ජාතික නිෂ්පාදනය, ආර්ථික වර්ධන වේගය
2. නූතන මිනුම් - මානව සංවර්ධන දර්ශකය, දුරකථන ඝනත්වය
25. භෞතික ජීවන තත්ත්ව දර්ශකය නූතන (මිනිමකි) සකස් කිරීමට ගත් දර්ශක -
සාක්ෂරතාව, උපතේ දී ආයු අපේක්ෂාව, ළදරු මරණ අනුපාතය
26. මානව සංවර්ධන දර්ශකය මැනීමට - උපතේ දී ආයු අපේක්ෂාව, අධ්‍යාපනය, ක්‍රය ශක්තිය
27. සංවර්ධනය අනුව රටවල් - ★සංවර්ධිත රටවල් - ඇමෙරිකාව, ජපානය, කැනඩාව
★සංවර්ධනය වෙමින් පවතින රටවල් - ලංකාව,ඉන්දියාව
28. සංවර්ධිත රටවල් මුහුණු දෙන ගැටලු - පරිසර දූෂණය, වෙළෙඳපොළ තරඟය, ත්‍රස්තවාදය
29. සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණු දෙන ගැටලු - විරැකියාව, මන්දපෝෂණය, ත්‍රස්තවාදී ගැටලු
30. සංවර්ධිත රටවල ලක්ෂණ - නාගරික ජන සංඛ්‍යාව වැඩිය, ආයු අපේක්ෂාව ඉහළය
31. සංවර්ධනය වන රටක් ශ්‍රී ලංකාවේ විශේෂත්වය -
★ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පැවතීම ★ළදරු මරණ හා මාතෘ මරණ පහළ මට්ටමක පැවිතීම
32. ශ්‍රී ලංකාව සංවර්ධන අභියෝග ජය ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග
★සංචාරක කර්මාන්තය දියුණු කිරීම. ★යටිතල පහසුකම් දියුණු කිරීම
★අපනයනය විවිධාංගීකරණය
33. තිරසර සංවර්ධනයේදී ලඟාකර ගත යුතු අභියෝග
- පරිසර සංවර්ධනය - ආකල්ප සංවර්ධනය, මූලික මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම
- ආර්ථික සංවර්ධනය - පරිසර හිතකාමී සම්පත් පරිහරණය, පරිසර සෞන්දර්ය රැක ගැනීම
- සමාජයීය අවශ්‍යතා - ලාභ ලැබීමේ නිෂ්පාදන ආකල්ප පාලනය
34. සම්පත්වල ඵලදායිතාව වැඩි කිරීමට භාවිකවන ක්‍රම - 3R සංකල්පය, 5S සංකල්පය, හරිත ඵලදායිතාව
35. 3R සංකල්පය - අවම කිරීම(reduce), නැවත භාවිතය(reuse), ප්‍රතිචක්‍රීයකරණය(recycle)
36. තිරසර සංවර්ධනය සඳහා පුරවැසි යුතුකම් - බලශක්ති සංරක්ෂණය,

අධි පරිභෝජනයෙන් වැළකීම,

කසල නිසි ලෙස බැහැර කිරීම

37. තිරසර සංවර්ධනය සඳහා රජයේ වගකීම් - පාරිසරික බලපෑම් තක්සේරු කිරීම
පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව යොමු කරවීම
පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

## ජාත්‍යන්තර සබඳතා

1. ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමේ අරමුණු
    - රටකට තනිව සපුරාගත නොහැකි අවශ්‍යතා ඉටු කර ගැනීම
    - ප්‍රබල රාජ්‍යවලින් එල්ල වන තර්ජනවලින් ආරක්ෂා වීම
2. ජාත්‍යනත්‍ර සබඳතා වර්ධනයවීමට බලපා ඇති සාධක -
    - අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම
    - අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම
3. බලවත් රාජ්‍ය දුබල රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර/ ලංකාවට බලපෑම් එල්ල කරන ආකාර
    1. ජාත්‍යන්තර වෙළෙඳාම
    2. රැකියා සැපයීම
    3. ණය හා ආධාර ලබා දීම
4. කලාපීය සංවිධාන පිහිටුවීමේ අරමුණු - යුධමය අරමුණු හා ආර්ථික සහයෝගීතාව ඇති කිරීම
5. යුධමය අරමුණු මත සංවිධාන - නෝටෝ සංවිධාන, වෝර්සෝ සංවිධානය
6. ආර්ථික සහයෝගීතාව ඇති කිරීමට - යුරෝපා අර්ථික ප්‍රජාව, යුරෝපා හවුල
7. ආසියානු කලාපයේ කලාපීය සංවිධාන -
    - සාර්ක් සංවිධානය - ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය
    - කොළඹ ක්‍රමය - ශ්‍රී ලංකාව, ඉන්දියාව, ජපානය, ඇමෙරිකාව
    - බිම්ස්ටෙක් - ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංගලාදේශය
    - ආසියාන් ක්‍රමය - මැලේසියාව, පිලිපීනය,තායිලන්තය

8. සාර්ක් සංවිධානයේ වෙළෙඳ ගිවිසුම්
    - දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම - තීරු බදු සහන ලබාදීම
    - දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම - ආර්ථික සහයෝගීතාව තර කිරීම
9. ආසියාන් සංවිධානය පිහිටුවීමේ අරමුණු - 1. සමාජික රටවල ජන ජීවිතය උසස් කිරීම
    2. සහයෝගීතාව මත ඒකාබද්ධ ආර්ථිකයක් ක්‍රියාත්මක කිරීම
10. අන්තර්ජාතික සංවිධාන - එක්සත් ජාතීන්ගේ සංවිධානය, පොදු රාජ්‍ය මණ්ඩලය
11. එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහය - මහ මණ්ඩලය. ලේකම් කාර්යාලය, ආරක්ෂබ මණ්ඩලය
12. ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් - චීනය, ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

13. ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යනු ලබන ආකාර -

- ජාත්‍යන්තර වෙළෙඳාම (ද්වි පාර්ශ්වීය වෙළෙඳාම හා බහු පාර්ශ්වීය වෙළෙඳාම)
- විදේශ ආධාර (පරිත්‍යාග, ණය, භාණ්ඩ හා සේවා)
- තානාපති සේවය

14. තානාපතිවරුන්ගේ කාර්යය - තම රටේ ප්‍රතිපත්ති අවබෝධ කර දීම
රාජ්‍ය අතර මිත්‍රත්වය වර්ධනය කිරීම

15. තානාපතිවරුන්ගේ ගුණාංග - තම රට හා තමා සේවය කරන රට පිළිබඳ අවබෝධයෙන් යුතුවීම
තම වෘත්තීය නිදහස, නීතිරීති, ආචාරධර්ම පිළිබඳ මනා අවබෝධය

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]